මාගේ මිනීවල උත්සව සමරන්නට නොගන්න. නුඹලාගේ නිවාස මිනීවලවල් බවට පත් කර නොගන්න. නුඹලා මට සලවාත් පවසන්න. සැබැවින්ම නුඹලාගේ සලාම් පැවසීම නුඹලා කොතැනක සිටිය ද මා හට දන්වනු ලබනු ඇත.

අලී ඉබ්නු අල් හසන් විසින් වාර්තා කරන ලදී. “සැබැවින්ම එතුමා නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාගේ මිනීවල අසළ තිබූ විවරයක් වෙත පැමිණ එහි ඇතුළු වී ප්රාර්ථනා කරන්නට විය. එවිට එතුමා ඔහුව වැළැක්වීය. එතුමා: අල්ලාහ්ගේ දූතයාණන් විසින් මාගේ සීයා ලබා ගෙන ඔහු විසින් මාගේ පියා ලබා ගෙන පවසා; එයට මා සවන් දුන් හදීසයක් මම නුඹලාට දන්වා සිටිය යුතු නොවේ ද? “මාගේ මිනීවල උත්සව සමරන්නට නොගන්න. නුඹලාගේ නිවෙස්
මිනීවලවල් බවට පත් කර නොගන්න. නුඹලා මට සලවාත් පවසන්න. සැබැවින්ම නුඹලාගේ සලාම් පැවසීම නුඹලා කොතැනක සිටිය ද මා හට දන්වනු ලබනු ඇත.” [හදීසය පැමිණි ඇති මාර්ග හා අනු සාක්ෂි තුළින් පූර්ව සාධක සහිත හදීසයකි] [ඉබ්නු අබී ෂයිබා එය වාර්තා
කර ඇත]

අලී ඉබ්නු අල් හුසෙයින් (රළියල්ලාහු අන්හු) තුමා නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාගේ මිනීවල අසල අල්ලාහ්ගෙන් ප්රාර්ථනා කරන මිනිසකු දුටුවේය. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාගේ මිනීවල බැහැදැකීම උත්සවයක් ලෙස ගැනීමෙන් එතුමා වළක්වා ඇති බවටත් අල්ලාහ්ට නැමදුම් කිරීමෙන් හා ඔහුව මෙනෙහි කිරීමෙන් ගෙවල් දුරස් කිරීමෙන් හා ඒවා මිනීවලවල්වලට සමාන කිරීමෙන් එතුමා වැළැක්වූ බවටත්. සැබැවින්ම මුස්ලිම්වරයාගේ සලාමය ඔහු කවර ස්ථානයක සිටි සලාම් පැවසුවද එය තමන්ට දන්වනු ඇති බවටත් වාර්තාවී ඇති හදීසයක් ආධාරකයක් ලෙස ගෙන හෙතෙම ඔහුව වැළක්වූ බව අපට දන්වා සිටියි.

https://sunnah.global/hadeeth/si/show/3346